# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 2003 අංක 26 දරන ඛනිජතෙල් සම්පත් පනත

---

[සහතිකය සටහන් කළේ 2003 සැප්තැම්බර් මස 09 වන දින.]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2003 සැප්තැම්බර් මස 12 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල : රු. 17.50 යි. තැපැල් ගාස්තුව : රු. 6.75 යි.

## 2003 අංක 26 දරන ඛනිජතෙල් සම්පත් පනත

[සහතිකය සටහන් කළේ 2003 සැප්තැම්බර් මස 09 වන දින]

එල්. ඩී.—ඕ. 1/2003.

**ශ්‍රී ලංකාව තුළ ඛනිජතෙල් සම්පත් කැණීම සහ ලබා ගැනීම සඳහා ද, ඒවා විධිමත් කිරීම සඳහා ද, 1961 අංක 28 දරන ලංකා ඛනිජතෙල් සංස්ථා පනතේ ඇතැම් විධිවිධාන ඉවත් කිරීම සඳහා ද, ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :-

**1.** මේ පනත 2003 අංක 26 දරන ඛනිජතෙල් සම්පත් පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය හැකි (මෙහි මින් මතු "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය.

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය.

### I වන කොටස

### ඛනිජතෙල් සම්පත්වල අයිතිය

**2.** ඛනිජතෙල් සම්පත් ඇත්තේ යම් පසක් යට ද ඒ පස කෙරෙහි යම් තැනැත්තකු සතුව තිබිය හැකි අයිතිය පිළිබඳ වූ හෝ අන්‍යාකාරයක කුමන අයිතිවාසිකමක් ඇත ද, ශ්‍රී ලංකාවේ-

ඛනිජතෙල් සම්පත්වල අයිතිය රජය සතු විය යුතු බව.

(අ) පොළොව මතුපිට ඇති ;

(ආ) අභ්‍යන්තර ජලයෙහි, ඓතිහාසික ජලයෙහි, දේශීය මුහුදෙහි, යාබද කලාපයෙහි, අන්තර් මහාද්වීප තීරවල සහ අනන්‍ය ආර්ථික කලාපවල,

ස්වාභාවිකව හටගන්නා වූ සියලුම ඛනිජතෙල් සම්පත්වල පරම අයිතිය රජය සතු විය යුතු ය.

**3.** ඛනිජතෙල් සම්පත් කැණීම සහ ප්‍රයෝජනයට යොදා ගැනීම ජාත්‍යන්තර වශයෙන් පිළිගනු ලැබූ ඉන්ජිනේරු පරිචයට සහ පිළිගත් තාක්ෂණය අනුගමනය කරමින් ආයෝජකයන්ගේ සහභාගිත්වය සමග ඒකාබද්ධව සිදුකරනු ලබන බවට සහතික වීම පිණිස රජය මගින් හැකි සෑම පියවරක්ම ගත යුතු ය.

රජය විසින් ජාත්‍යන්තර පරිචයට අනුකූලව ඛනිජතෙල් සම්පත් සංවර්ධනය කළ යුතු බව.

ඛනිජතෙල් සම්පත් කැණීමට අදාළ ගිවිසුම්.

**4.** (1) යම් ආයෝජකයකු සමග ඒකාබද්ධ වී ඛනිජතෙල් සම්පත් සෙවීම, කැණීම සහ තම ප්‍රයෝජනය සඳහා යොදා ගැනීම, ප්‍රවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකාවේ රජය සඳහා සහ එය වෙනුවෙන් ගිවිසුම්වලට ඇතුළත් වීමේ බලය අමාත්‍ය මණ්ඩලය විසින් අමාත්‍යවරයාට පවරනු ලැබිය හැකි ය.

(2) 7 වන වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකාවේ ආණ්ඩුව සමග එළඹෙන ඛනිජතෙල් සම්පත් ගිවිසුම් ක්‍රියාත්මක කිරීම සඳහා එවැනි සෑම ගිවිසුමක්ම ශ්‍රී ලංකාවේ ආණ්ඩුව සහ තැනැත්තකු හෝ පුද්ගල මණ්ඩලයක් අතර විය යුතු ය.

## II වන කොටස

### ඛනිජතෙල් සම්පත් සංවර්ධන කමිටුව

ඛනිජතෙල් සම්පත් සංවර්ධන කමිටුව පිහිටුවීම.

**5.** (1) (මෙහි මින් මතු "ඛ.ස.සං. කමිටුව" යනුවෙන් හඳුන්වනු ලබන) ඛනිජතෙල් සම්පත් සංවර්ධන කමිටුව නම් වූ කමිටුවක් පිහිටුවනු ලැබිය යුතු අතර, මේ පනතේ විධිවිධාන කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා වූ වගකීම එම කමිටුව වෙත පවරනු ලැබිය යුතු ය.

(2) කමිටුව අමාත්‍යවරයා විසින් පත්කරනු ලැබිය යුතු අතර, පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය :–

(අ) කමිටුවේ සභාපතිවරයා විය යුතු ඛනිජතෙල් සම්පත් සංවර්ධන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා ;

(ආ) විදුලිබල විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා ;

(ඇ) බලශක්ති විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා ;

(ඈ) මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා ;

(ඉ) පාරිසරික විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා ;

(ඊ) ස්වාභාවික සම්පත් විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා ;

(උ) ධීවර විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා ;

(ඌ) සමුද්‍ර සම්පත් විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා ;

(එ) රාජ්‍ය ආරක්ෂක විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා ;

(ඒ) 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ සභාපතිවරයා ;

(ඔ) ප්‍රතිපත්ති සංවර්ධන සහ ක්‍රියාත්මක කිරීමේ විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශය විසින් නම් කරනු ලබන තැනැත්තෙක් ;

(ඕ) ඛනිජතෙල් සම්පත් සංවර්ධනයට අදාළව අවශ්‍ය සුදුසුකම් සහ පළපුරුද්ද ඇති තැනැත්තකු විය යුතු වූ ද, ඛනිජ තෙල් සම්පත් සංවර්ධන විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන්නා වූ ද තැනැත්තෙක්.

(3) (2) වන උපවගන්තියේ (අ) සිට (ඌ) දක්වා වූ ඡේදවල නිශ්චිතව දක්වා ඇති විෂයයන් දෙකක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් එක් අමාත්‍යවරයකු වෙත පවරා ඇති අවස්ථාවක නැතහොත් එම විෂයයන් පිළිබඳව එක් අමාත්‍යවරයකු භාරව සිටින අවස්ථාවක, ඒ විෂයයන් සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින්, එක් නියෝජිතයකු පමණක් නම් කරනු ලැබිය යුතු ය.

(4) (2) වන උපවගන්තියේ (ඔ) සහ (ඕ) ඡේද යටතේ පත් කරනු ලැබූ තැනැත්තන්ට ශ්‍රී ලංකාවේ ඛනිජතෙල් සම්පත් සංවර්ධනය කිරීමෙහි ලා කිසිදු වාණිජ සම්බන්ධතාවක් නොතිබිය යුතු ය.

(5) (මෙහි මින් මතු "අධ්‍යක්ෂ ජනරාල්වරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) ඛනිජතෙල් සම්පත් අධ්‍යක්ෂ ජනරාල්වරයා ප්‍රධානයා වශයෙන් කටයුතු කරන ලේකම් කාර්යාලයක් මගින් ඛ. ස. සං. ක. ට සහාය ලබාදිය යුතු ය.

බනිජතෙල් සම්පත් සංවර්ධන කමිටුවේ බලතල සහ කර්තව්‍ය.

6. ඛනිජතෙල් සම්පත් සංවර්ධන කමිටුවේ බලතල සහ කර්තව්‍ය පහත සඳහන් පරිදි විය යුතු ය :-

(අ) ශ්‍රී ලංකාව තුළ ඛනිජතෙල් සම්පත් සංවර්ධනය කිරීම, ප්‍රවර්ධනය කිරීම සඳහා අරමුණු කරගත් ප්‍රතිපත්ති සකස් කිරීම සහ සැළසුම් පිළියෙල කිරීම ;

(ආ) මිලගණන් කැඳවීම සහ එයට ප්‍රතිචාර වශයෙන්, නිර්ණය කරන ලද කැණීමේ බිම් කොටස් සම්බන්ධයෙන් ඛනිජතෙල් සම්පත් ගිවිසුම්වලට ඇතුළත් වීමේ අදහසින් යම් ආයෝජකයකුගෙන් ලැබුණු මිලගණන් පත්වලට අදාළ ඉල්ලුම් පත්‍ර අගැයීමේ දී සහාය දැක්වීම සහ ඉල්ලුම්කරුවන් නියමිත මූල්‍ය සහ තාක්ෂණික සුදුසුකම් සපුරාලන්නේ ද යන්න තීරණය කිරීම ;

(ඇ) ආදර්ශ ඛනිජතෙල් සම්පත් ගිවිසුම් පිළියෙල කිරීම ;

(ඈ) ඛනිජතෙල් සම්පත් ගිවිසුම්වල ඇතුළත් කළ යුතු නියමයන් සම්බන්ධයෙන් එකගත්වයකට එළඹීම පිණිස රජය සඳහා හෝ රජය වෙනුවෙන් පවත්වනු ලබන සාකච්ඡාවලට සහාය දැක්වීම සහ 4 වන වගන්තියේ විධිවිධාන සලසා ඇති පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඒවා ඉදිරිපත් කිරීම ;

(ඉ) ඛනිජතෙල් සම්පත් ගිවිසුම් සකස් කොට අවසන් කිරීමේ අදහසින් පවත්වනු ලබන සාකච්ඡාවලට සහාය දීමට නම් කරනු ලබන තැනැත්තකු පත් කිරීම ;

(ඊ) සියලුම කැණීම් ඉඩම් සහ මේ පනත යටතේ නිකුත් කරනු ලැබූ සංවර්ධන බලපත්‍ර මගින් ආවරණය වන බිම් ප්‍රදේශ සම්බන්ධයෙන් රෙජිස්ටර්, සිතියම් හා වෙනත් වාර්තා පවත්වාගෙන යාම ;

(උ) ශ්‍රී ලංකාව තුළ ඇති ඛනිජතෙල් සම්පත්වලට අදාළ භූවිද්‍යාත්මක, භූ භෞතික, ඉංජිනේරුමය සහ ආර්ථික දත්තයන් එකතු කිරීමට, ගොනු කිරීමට, විශ්ලේෂණය කිරීමට සහ ප්‍රකාශයට පත් කිරීමට කටයුතු සැලැස්වීම සහ එසේ එකතු කර ගත් දත්ත සඳහා බුද්ධිමය දේපළවලට සම්බන්ධ නීතිය අදාළ කර ගන්නා බවට සහතික වීම ;

(ඌ) භූවිද්‍යාත්මක සාම්පල එකතු කර ගබඩා කිරීම සඳහා කටයුතු සැලැස්වීම සහ තාක්ෂණිකව අගැයීමේ කාර්ය සඳහා එම සාම්පල ශ්‍රී ලංකාවෙන් පිටතට ගෙන ගොස් ආපසු ශ්‍රී ලංකාවට ගෙන ඒම සඳහා අවසර දීම ;

(එ) මේ පනත ප්‍රකාරව බලපත්‍ර නිකුත් කිරීම සහ එම බලපත්‍ර අවලංගු කිරීම, අත්හිටුවීම සහ වෙනස් කිරීම හෝ සංශෝධනය කිරීම ;

(ඒ) මෙහි 13 වන වගන්තිය ප්‍රකාරව සංවර්ධන බලපත්‍ර අත්හිටුවීම හෝ අවලංගු කිරීම ;

(ඔ) මේ පනතේ කාර්යය සැලකිල්ලට ගෙන සාධාරණ කොන්දේසි මත මේ පනත ප්‍රකාරව නිකුත් කරනු ලැබූ සංවර්ධන බලපත්‍රයක කොන්ත්‍රාත්කරුවකුගේ සහභාගිවීමේ සම්බන්ධතාවක් පැවරීම හෝ මාරු කිරීම අනුමත කිරීම ;

(ඕ) ශ්‍රී ලංකාව තුළ කොන්ත්‍රාත්කරුවන් විසින් පවත්වනු ලබන ඛනිජතෙල් මෙහෙයුම් නියාමනය කිරීම, සොයාගනු ලැබූ ඛනිජතෙල් සම්පත්වල ප්‍රමාණයන් මැනීම සහ ඒවායේ සාම්පල ලබා ගැනීම සහ කොන්ත්‍රාත්කරුවකු විසින් පවත්වා ගෙන යනු ලබන යම් පොත්පත්, සටහන්, වාර්තා, ගිණුම් සාම්පල සහ දත්ත පරීක්ෂා කිරීම ;

(ක) මේ පනත යටතේ හෝ එය යටතේ සාදන ලද යම් නියෝගයක් යටතේ හෝ යම් ඛනිජතෙල් සම්පත් ගිවිසුමක් ප්‍රකාරව හෝ රජයට අයවිය යුතු සියලු ගාස්තු, රාජ්‍ය භාග සහ ගෙවීම් ඉල්ලා සිටීම, ලබාගැනීම සහ ආපසු අයකර ගැනීම සහ එම මුදල් ශ්‍රී ලංකාවේ ඒකාබද්ධ අරමුදලට බැර කිරීම ; සහ

(ග) ඛ. ස. සං. කමිටුවේ බලතල හෝ කර්තව්‍ය නිසි පරිදි ඉටු කිරීම සඳහා අවශ්‍ය යයි එම කමිටුව විසින් සලකනු ලබන වාර්තා හෝ තොරතුරු සපයන ලෙස, සංවර්ධන බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති කොන්ත්‍රාත්කරුවකුට ලිඛිත දැන්වීමක් මගින් නියම කිරීම.

## III වන කොටස

### ඛනිජතෙල් සම්පත් ගිවිසුම්, කැණීමේ බිම් කොටස් සහ සංවර්ධන බලපත්‍ර

ඛනිජතෙල් මෙහෙයුම් පැවැත්වීම පිළිබඳ සීමා කිරීම.

**7.** යම් තැනැත්තකු රජය සමග ඛනිජතෙල් සම්පත් ගිවිසුමකට හෝ වෙනත් යම් උචිත ගිවිසුමකට ඇතුළත්ව ඇත්නම් මිස, හෝ ඛනිජතෙල් මෙහෙයුම් පැවැත්වීම සඳහා මේ පනත මගින් හෝ ඒ යටතේ අන්‍යාකාරයකට බලය පවරා ඇත්නම් මිස, කිසිම තැනැත්තකු විසින් ශ්‍රී ලංකාව තුළ ඛනිජතෙල් මෙහෙයුම් සිදු නොකළ යුතු ය.

කැණීමේ බිම් කොටස් සම්බන්ධයෙන් ගිවිසුම්වලට ඇතුළත්වීම සඳහා ඉල්ලුම් කිරීම.

**8.** (1) ඛ. ස. සං. කමිටුව විසින් දේශීය හෝ ජාත්‍යන්තර මාධ්‍යවල පළ කරනු ලබන දැන්වීමක් මගින් හෝ තත් කාර්ය සඳහා ප්‍රසිද්ධිය ලබා දීමට ඉතා සුදුසු වෙනත් මාර්ගයකින් ඒ දැන්වීමෙහි නිශ්චිතව දක්වනු ලැබිය හැකි නිර්ණය කරන ලද කැණීමේ බිම් කොටස් සම්බන්ධයෙන් රජය සමග ඛනිජතෙල් සම්පත් ගිවිසුමකට ඇතුළත් වීම සඳහා ඉල්ලුම් කරන ලෙස, නියම කරනු ලැබිය හැකි තාක්ෂණික සහ මූල්‍ය සුදුසුකම් ඇති තැනැත්තන්ට ආරාධනා කළ හැකි ය.

(2) නිර්ණය කරන ලද කැණීමේ බිම් කොටසක් සම්බන්ධයෙන් රජය සමග ඛනිජතෙල් සම්පත් ගිවිසුමකට ඇතුළත්වීම සඳහා වූ සෑම ඉල්ලුම් පත්‍රයක්ම ඛ. ස. සං. ක. වෙත නියමිත ආකෘති පත්‍රයෙහි ඉදිරිපත් කළ යුතු අතර, නියමිත විස්තර අන්තර්ගත විය යුතු ය.

(3) එක් එක් ඛනිජතෙල් සම්පත් ගිවිසුම එක් එක් කැණීමේ බිම් කොටසක් සම්බන්ධයෙන් පමණක් විය යුතු ය.

ඛනිජතෙල් සම්පත් ගිවිසුම.

**9.** (1) 8 වන වගන්තිය යටතේ ඛනිජතෙල් සම්පත් සංවර්ධන කමිටුව වෙත ඉල්ලීම් ලැබුණු අවස්ථාවක දී එම කමිටුව විසින් ඒ ඉල්ලීම් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතු අතර අමාත්‍ය මණ්ඩලය විසින් සියලුම ඉල්ලුම්පත් සලකා බැලීමෙන් පසුව ඛනිජතෙල් මෙහෙයුම් සිදුකිරීම සඳහා පළපුරුද්ද සහ තාක්ෂණ හැකියාව අනුව ඉතාම සුදුසු තැනැත්තා බවට අමාත්‍ය මණ්ඩලය විසින් සලකනු ලබන්නා වූ සහ තම මතය අනුව ස්වකීය සහභාගිත්වය මගින් ශ්‍රී ලංකාවට උපරිම ආර්ථික ප්‍රතිලාභ ලබාදිය හැකි වන්නා වූ ද තැනැත්තා අමාත්‍ය මණ්ඩලය විසින් ඉල්ලුම්කරුවන් අතරින් තෝරා ගත යුතු ය. (මේ වගන්තියේ ඒ තැනැත්තා "ප්‍රමුඛත්වය දෙන ලද ඉල්ලුම්කරු" යනුවෙන් හඳුන්වනු ලැබේ.)

(2) ප්‍රමන්ත්‍රණ පවත්වා, අදාළ ඛණිජ තෙල් සම්පත් ගිවිසුමෙහි ඇතුළත් කිරීම සඳහා තමන් යෝජනා කරන කාරණ, අනුමතය සඳහා අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට, අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ප්‍රමන්ත්‍රණ කමිටුව (CANC) යනුවෙන් හඳුන්වනු ලබන ප්‍රමන්ත්‍රණ කමිටුවකට හෝ ඛ. ස. සං. කමිටුවට හෝ අමාත්‍ය මණ්ඩලය විසින් බලය දෙනු ලැබිය හැකි ය. අමාත්‍ය මණ්ඩලය විසින් ඉන් අනතුරුව එකඟ වූ පරිදි නිශ්චිත කැණීමේ බිම් කොටස හෝ එහි යම් කොටසක් සම්බන්ධයෙන් ඛනිජතෙල් සම්පත් ගිවිසුමකට ඇතුළත් විය යුතු ය. ඒ ගිවිසුම මේ කාර්ය සඳහා පිළියෙල කරන ලද ආදර්ශ ගිවිසුමට සාරානුකූල විය යුතු අතර එය 4 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව අවසන් කරනු ලැබිය යුතු ය. ඒ ගිවිසුම ඛනිජතෙල් සම්පත් ගිවිසුමකට යටත් විය යුතු කොන්දේසි වශයෙන් අමාත්‍ය මණ්ඩලය විසින් කලින් කල තීරණය කරනු ලැබිය හැකි කොන්දේසිවලට යටත් විය යුතු ය. අදාළවන කොන්දේසිවල යම් සංශෝධනයක් හෝ වෙනස් කිරීමක් අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ඇතිව පමණක් සිදු කළ යුතු ය.

ඛනිජතෙල් සම්පත් සොයාගැනීම සඳහා වූ සංවර්ධන බලපත්‍ර.

10. (1) කැණීමේ බිම් කොටසක් ඇතුළත කොන්ත්‍රාත්කරුවකු විසින් කැණීම් කටයුතු ඉටු කිරීමේ දී වාණිජ වශයෙන් වටිනාකම ඇති ප්‍රමාණවලින් ඛනිජතෙල් සම්පත් සොයාගත හැකි වුවහොත් ඔහු විසින් ඛ. ස. සං. කමිටුව අනුමතිය සඳහා ව්‍යාපෘති සංවර්ධන සහ ආයෝජන යෝජනාක්‍රමයක් ඉදිරිපත් කළ යුතු ය. එම යෝජනාක්‍රමය ඛ. ස. සං. ක. විසින් පිළිගත හැකි නම් සහ ඒ යෝජනාක්‍රමය ඛ. ස. සං. කමිටුව අනුමත කරනු ලබන්නේ නම්, තමාගේ ඛනිජතෙල් සම්පත් ගිවිසුම අදාළවන කැණීමේ බිම් කොටසෙහි නම් කරන ලද ප්‍රදේශය ඇතුළත තම යෝජනාක්‍රමයේ දක්වා ඇති පරිදි ඛනිජතෙල් සම්පත්වල වාණිජ ප්‍රමාණයන් සොයා ගැනීම සඳහා ඛ. ස. සං. ක. විසින් කොන්ත්‍රාත්කරු වෙත සංවර්ධන බලපත්‍රයක් නිකුත් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් ඛනිජ තෙල් සම්පත්වල වාණිජ වශයෙන් වටිනාකම ඇති ප්‍රමාණයන් එක් කැණීම් බිම් කොටසකට වඩා වැඩි ප්‍රමාණයක දී හමුවන අවස්ථාවක එම කැණීම් බිම් කොටස සම්බන්ධයෙන් වෙනත් කොන්ත්‍රාත්කරුවකු සමඟ ඛනිජතෙල් සම්පත් ගිවිසුමකට ඇතුළත් වී නොමැති නම් ඛනිජතෙල් සම්පත් සොයාගනු ලැබූ සම්පූර්ණ ප්‍රදේශය සම්බන්ධයෙන් ඛ. ස. සං. කමිටුව විසින් කොන්ත්‍රාත්කරුවකුහට සංවර්ධන බලපත්‍රයක් නිකුත් කරනු ලැබිය හැකි ය.

සංවර්ධන බලපත්‍රවලට අදාළවන කොන්දේසි.

**11.** (1) ඛ. ස. සං. කමිටුව විසින් 10 වන වගන්තිය යටතේ නිකුත් කරනු ලැබූ සංවර්ධන බලපත්‍රයක් මගින් ආවරණය වන ප්‍රදේශය ඇතුළත ඛනිජතෙල් මෙහෙයුම් කාර්යක්ෂම ලෙස සිදු කරන බවට සහතික වීම පිණිස එම බලපත්‍රය යටත් කරනු ලැබිය යුතු කොන්දේසි අමාත්‍ය මණ්ඩලය විසින් කලින් කල තීරණය කරනු ලැබිය යුතු ය. අදාළ වන කොන්දේසිවල යම් සංශෝධනයක් හෝ වෙනස් කිරීමක් අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ඇතිව පමණක් සිදු කළ යුතු ය.

(2) අමාත්‍ය මණ්ඩලය ඛනිජතෙල් සම්පත් සංවර්ධන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ සහ ඛ. ස. සං. ක. විමසා-

(අ) නාවික ගමනාගමනය පවත්වාගෙන යාම සඳහා ද, පරිසරය ආරක්ෂා කිරීම සඳහා ද ජන සමාජය මත ඇතිකරන අහිතකර සමාජ බලපෑම් අඩු කිරීම සඳහා සහ ජාතික ආරක්ෂාවේ යහපත උදෙසා ද සංවර්ධන බලපත්‍රයකට ඇතුළත් කළ යුතු අතිරේක කොන්දේසි ; සහ

(ආ) සංවර්ධන බලපත්‍රය නිකුත් කරනු ලැබුවේ යම් ප්‍රදේශයක් සඳහා ද එම ප්‍රදේශය ඇතුළත ඛනිජතෙල් මෙහෙයුම් සිදුකිරීම මගින් අහිතකර බලපෑම් ඇතිවිය හැකි යම් තැනැත්තකුට කොන්ත්‍රාත්කරු විසින් ගෙවිය යුතු සාධාරණ වන්දි මුදල් ප්‍රමාණය,

තීරණය කරනු ලැබිය හැකි ය.

(3) යම් ප්‍රදේශයකින් ඛනිජතෙල් සම්පත් උපරිම ලෙස කාර්යක්ෂමව සොයා ගැනීම සහතික කරමින් යම් කාලසීමාවක් සඳහා යම් කැණීමේ බිම් කොටසක නම් කරන ලද ප්‍රදේශයක් සම්බන්ධයෙන් ඛ. ස. සං. ක. කමිටුව විසින් සංවර්ධන බලපත්‍රයක් නිකුත් කරනු ලැබිය යුතු ය. එසේ වුව ද, එම කාලසීමාව එම කැණීමේ බිම් කොටස සම්බන්ධයෙන් ඛනිජතෙල් සම්පත් ගිවිසුමට ඇතුළත් වී ඇති කාලසීමාව නොඉක්මවිය යුතු ය.

(4) ඛ. ස. සං. ක. කමිටුවේ බලතල නිසිලෙස ක්‍රියාත්මක කිරීම සඳහා ද, කර්තව්‍ය නිසි ලෙස ඉටුකිරීම සඳහා ද, අවශ්‍ය යයි එම කමිටුව විසින් සලකනු ලබන යම් වාර්තාවක් හෝ තොරතුරක් ඉදිරිපත් කරන ලෙස එම කමිටුව විසින් ලිඛිත දැන්වීමක් මගින් කොන්ත්‍රාත්කරුවකුට නියම කරනු ලැබිය හැකි අතර, ඒ දැන්වීමේ සඳහන් නියමයන්ට අනුකූලව ක්‍රියා කිරීම ඒ කොන්ත්‍රාත්කරුගේ කාර්ය වන්නේ ය. මේ උපවගන්තිය යටතේ යවන ලද දැන්වීමක නියමයන්ට අනුකූලව ඉදිරිපත් කරන ලද යම් වාර්තාවක ඇති තොරතුරු හෝ අන්තර්ගත කරුණු එම

වාර්තාව හෝ තොරතුරු සපයන ලද කොන්ත්‍රාත්කරුගේ කැමැත්ත ඇතිව මිස හෝ ඛ. ස. සං. කමිටුවේ කර්තව්‍ය ඉටු කිරීමේ දී හැර එම තොරතුරු හෝ අන්තර්ගත කරුණු ප්‍රසිද්ධ කිරීම හෝ යම් තැනැත්තකුට දැනුම් දීම නොකළ යුතු ය.

සංවර්ධන බලපත්‍රයක කොන්දේසි කඩකිරීම පිළිබඳව ඛ. ස. සං. කමිටුව විසින් කොන්ත්‍රාත්කරු වෙත දැනුම් දිය යුතු බව.

**12.** සංවර්ධන බලපත්‍රයක අන්තර්ගත කොන්දේසි කොන්ත්‍රාත්කරුවකු විසින් උල්ලංඝනය කරන බවට විශ්වාස කිරීමට ඛ. ස. සං. කමිටුවට සාධාරණ හේතු ඇති අවස්ථාවක-

(අ) උද්දේශිත උල්ලංඝනය කිරීම් නිශ්චිතව දක්වමින් ;

(ආ) එම උල්ලංඝනය කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් ඇති වූ තත්ත්වය ප්‍රතිශෝධනය කරන ලෙස හෝ ප්‍රතිශෝධනය කිරීම හෝ නිවැරදි කිරීම සඳහා සාධාරණ පියවර ගන්නා ලෙස නැතහොත් උල්ලංඝනය කිරීම පිළිබඳ සාධාරණ හේතු පෙන්නුම් කරන ලෙස හෝ දැන්වීමේ නිශ්චිතව දක්වා ඇති කාලසීමාව ඇතුළත උල්ලංඝනය කිරීම සිදු වී නැති බව පෙන්වන ලෙස කොන්ත්‍රාත්කරුට නියම කරමින් ;

(ඇ) දැන්වීමේ නියමයන්ට අනුකූලව ක්‍රියා කිරීමට අපොහොසත්වීම මගින් සංවර්ධන බලපත්‍රය අත්හිටුවීමට හෝ අවලංගු කිරීමට සිදුවිය හැකි බව සඳහන් කරමින්,

එම ඛ. ස. සං. කමිටුව විසින් කොන්ත්‍රාත්කරු වෙත දැන්වීමක් යැවීමට කටයුතු සලස්වනු ලැබිය හැකි ය.

සංවර්ධන බලපත්‍ර අත්හිටුවීම හෝ අවලංගු කිරීම.

**13.** (1) සංවර්ධන බලපත්‍රයක් නිකුත් කරනු ලැබුවේ යම් කොන්ත්‍රාත්කරුවකු වෙත ද එම කොන්ත්‍රාත්කරු-

(අ) 12 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද දැන්වීමකට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හැර ඇති බවට හෝ ඒ දැන්වීමේ සඳහන් උල්ලංඝනය කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් ඇති වූ තත්ත්වය ප්‍රතිශෝධනය කිරීමට හෝ නිවැරදි කිරීමට සාධාරණ පියවර ගෙන නැති බවට හෝ ඒ උල්ලංඝනය කිරීම සඳහා සාධාරණ හේතු පෙන්වා නොමැති බවට ;

(ආ) මේ පනත යටතේ ඛ. ස. සං. කමිටුව විසින් දෙන ලද යම් විධානයකට අනුකූලව ක්‍රියා කර නැති බවට ;

(ඇ) (i) ඛනිජතෙල් සම්පත් ගිවිසුමේ කොටසක් වන වැඩ සටහන්වලට ; හෝ

(ii) සංවර්ධන බලපත්‍රය සඳහා ඉදිරිපත් කරන ලද වැඩ සැලසුමට,

අනුකූලව ඛනිජතෙල් මෙහෙයුම් සිදුකිරීම නවතා ඇති බවට ;

(ඇ) සංවර්ධන බලපත්‍රය මගින් ආවරණය වන ප්‍රදේශය තුළ ඛනිජතෙල් මෙහෙයුම් උද්යෝගිමත් ලෙස සිදු කිරීමට අපොහොසත් වීම මගින් සංවර්ධන බලපත්‍රය අත්හැර දමා ඇති බවට හෝ සම්ප්‍රයුක්ත ලෙස අත්හැර දමා ඇති බවට ; හෝ

(ඉ) සංවර්ධන බලපත්‍රය ආපසු භාර දී ඇති බවට ; හෝ

(ඊ) මේ පනත යටතේ හෝ මේ පනත යටතේ වූ යම් නියෝගයක් යටතේ යම් වරදකට, වරදකරු වී ඇති බවට,

ඛ. ස. සං. කමිටුව සෑහීමට පත්වන අවස්ථාවක එම කමිටුව විසින් සංවර්ධන බලපත්‍රය අත්හිටුවීම හෝ අවලංගු කිරීම සිදු කළ හැකි ය.

(2) 10 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද සංවර්ධන බලපත්‍රයක් අත්හිටුවීමට හෝ අවලංගු කිරීමට ඛ. ස. සං. කමිටුව විසින් ගන්නා ලද තීරණයකින් අතෘප්තියට පත් කොන්ත්‍රාත්කරුවකුට, අදාළ ඛනිජතෙල් සම්පත් ගිවිසුමේ කොටසක් වන්නා වූ බේරුම් කිරීමේ විධිවිධාන තිබේ නම්, එම කරුණු විසඳීම සඳහා එකී විධිවිධානවල පිහිට පැතිය හැකි ය.

සංවර්ධන බලපත්‍රයක් යටතේ කොන්ත්‍රාත්කරුවකුගේ අයිතිවාසිකම්.

**14.** සංවර්ධන බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇත්තේ යම් කොන්ත්‍රාත්කරුවකුට ද එම කොන්ත්‍රාත්කරුට මේ පනතේ විධිවිධානවලට යටත්ව අදාළ ඛනිජතෙල් සම්පත් ගිවිසුමේ නියමයන් යටතේ එම කොන්ත්‍රතකරුට හිමි ඛනිජතෙල් සම්පත්වල තමාගේ කොටස සොයා ගැනීමට, ගබඩා කිරීමට, ප්‍රවාහනය කිරීමට සහ විකිණීමට අයිතිය ඇති අතර එම ඛනිජතෙල් සම්පත් විකිණීමෙන් ලැබෙන මුදල් පිටරට යැවීමේ අයිතිය ද ඇත.

සංවර්ධන බලපත්‍රයේ සහභාගිවීමේ අයිතිය මාරු කිරීම.

**15.** (1) කොන්ත්‍රාත්කරුවකු විසින්, අමාත්‍ය මණ්ඩලයේ අනුමතය ඇතිව සහ මේ සම්බන්ධයෙන් ඔවුන් විසින් පනවනු ලැබිය හැකි කොන්දේසිවලට යටත්ව සංවර්ධන බලපත්‍රයේ සහභාගිවීමේ සම්බන්ධතාව මාරුකිරීමට හෝ පැවරීමට අයිතියක් ඇත.

(2) (අ) පැවරුම්ලාභියා හෝ මාරුකිරීම්ලාභියා යහපත් තත්ත්වයෙන් සිටී නම්, ස්වකීය වගකීම් ඉටු කිරීමට මූල්‍ය හැකියාවක් ඇත්නම් සහ ස්වකීය වගකීම් ඉටු කිරීම සඳහා ඛ. ස. සං. කමිටුවට කොන්දේසි විරහිත පොරොන්දුවක් දීමට කැමැත්තෙන් සිටී නම් සහ අදාළ ඛනිජතෙල් සම්පත් ගිවිසුමේ විධිවිධාන සලසා ඇති පරිදි ඇප ඉදිරිපත් කිරීමට කැමති නම් ;

(ආ) පැවරුම්ලාභියා හෝ මාරුකිරීම්ලාභියා රජය වෙළෙඳාම් හෝ ව්‍යාපාර පරිසීමා කොට ඇති රටක සංස්ථාගත කරන ලද සමාගමක් නොවන්නේ නම් ;

(ඇ) ගිවිසුම කාර්යක්ෂම ලෙස ඉටු කිරීම සහතික වන පරිදි අමාත්‍ය මණ්ඩලය විසින් පනවනු ලැබිය හැකි යම් සාධාරණ කොන්දේසිවලට අනුකූලව ක්‍රියා කිරීමට පිළිවෙළින් පවරන්නා හෝ මාරුව කරන්නා සහ පැවරුම්ලාභියා හෝ මාරුකිරීම්ලාභියා කැමැත්තෙන් සිටී නම් ; සහ

(ඈ) පැවරීම හෝ මාරු කිරීම මගින් ගිවිසුම යටතේ කටයුතු සිදුකිරීමට හෝ වගකීම්වලට අහිතකර බලපෑම් සිදුනොවන්නේ නම් හෝ එම පැවරීම හෝ මාරු කිරීම රජයේ සම්බන්ධතාවට පටහැනි බවට කවර හෝ ආකාරයකින් තේරුම් ගත නොහැකි නම්,

කොන්ත්‍රාත්කරුවකුගේ සහභාගිවීමේ සම්බන්ධතාවක් මාරු කිරීම හෝ පැවරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් අනුමතය ලබා දිය යුතු ය.

(3) (අ) මාරු කිරීමක් හෝ පැවරීමක් සඳහා අනුමතය ලබා නොදෙමින් ; හෝ

(ආ) මාරු කිරීම හෝ පැවරීම සඳහා අනුමතය ලබා දීමේ දී එම අනුමතය යටත්වන කොන්දේසි පනවමින් ,

අමාත්‍ය මණ්ඩලය විසින් දෙන ලද තීරණයකින් අතෘප්තියට පත් කොන්ත්‍රාත්කරුවකු විසින් එම කරුණ විසඳීම සඳහා අදාළ ඛනිජතෙල් සම්පත් ගිවිසුමේ නිශ්චිතව දක්වා ඇති කාර්ය පටිපාටියේ පිහිට පැතිය හැකි ය.

සේවා උප කොන්ත්‍රාත්කරුවන්ට බලපත්‍ර ලබා දීම.

**16.** (1) ඛ. ස. සං. කමිටුව විසින් ඒ සම්බන්ධයෙන් නිකුත් කරන ලද බලපත්‍රයක අධිකාරිය යටතේ මිස, කිසිම තැනැත්තකු විසින් ඛනිජතෙල් මෙහෙයුම් සේවා උප කොන්ත්‍රාත්කරුවකු වශයෙන් ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාම නොකළ යුතු ය.

(2) ඛනිජතෙල් මෙහෙයුම් සේවා උප කොන්ත්‍රාත්කරුවකු වශයෙන් ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාමට අපේක්ෂා කරන සෑම තැනැත්තකු විසින්ම තත්කාර්ය සඳහා බලපත්‍රයක් ලබා ගැනීමට, නියමිත ආකෘති පත්‍රයෙහි වූ ඉල්ලීමක් ඛ. ස. සං. කමිටුව වෙත ඉදිරිපත් කළ හැකි ය.

(3) (2) වන උපවගන්තිය යටතේ ඛ.ස.සං. කමිටුව වෙත ඉල්ලීමක් ලැබුණු විට, ඉල්ලුම්කරු එම ව්‍යාපාරය පවත්වා ගෙන යාමට තාක්ෂණික වශයෙන් සුදුසුකම් ලබා ඇති බවට සහ ඒ සඳහා ප්‍රමාණවත් මූල්‍ය පහසුකම් ඇති බවට ඛ.ස.සං.කමිටුව සෑහීමට පත්වන්නේ නම් එම කමිටුව විසින් බලපත්‍රයේ නිශ්චිතව සඳහන් ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා ඉල්ලුම්කරුට බලය පවරමින් බලපත්‍රයක් නිකුත් කරනු ලැබිය හැකි ය.

සංවර්ධන බලපත්‍රවල සහභාගිවීමේ සම්බන්ධතාව ඇති තැනැත්තන්ගේ වගකීම.

**17.** ඛනිජතෙල් ගිවිසුමක නියමයන්හි කුමක් සඳහන් වුව ද, සංවර්ධන බලපත්‍රයක සහභාගිවීමේ සම්බන්ධතාව ඇති සියලු තැනැත්තන් –

(අ) ඛනිජතෙල් සම්පත් ගිවිසුමේ නියමයන්ට අනුකූලව ක්‍රියා කරන බවට සහතික වීම සඳහා ;

(ආ) සංවර්ධන බලපත්‍රයක කොන්දේසි සහ මේ පනත යටතේ සාදන ලද නියෝගවලට අනුකූලව ක්‍රියා කරන බවට සහතික වීම සඳහා ; සහ

(ඇ) සංවර්ධන බලපත්‍රයේ විස්තර කර ඇති ප්‍රදේශවල පවත්වනු ලබන ඛනිජතෙල් මෙහෙයුම්වල ප්‍රතිඵලයක් වශයෙන් හානි හෝ අලාභ සිදු වන තුන්වන පාර්ශ්වයන් සම්බන්ධයෙන්,

වගකිව යුතු ය :

එසේ වුව ද, යම් හානියක් හෝ අලාභයක් සඳහා අලාභ මුදල් ගෙවන ලෙස නියම කරනු ලැබූ සහභාගිවීමේ සම්බන්ධතාවක් ඇති තැනැත්තකු විසින් එම අලාභ මුදල්, සංවර්ධන බලපත්‍රය සම්බන්ධව සහභාගිවීමෙන් සම්බන්ධතා ඇති වෙනත් තැනැත්තන් සමග දායකවීමේ පදනමක් මත ගෙවනු ලැබිය යුතු ය.

18. (1) ඛනිජතෙල් සම්පත් ආකරයක කොටසක් වෙනත් කොන්ත්‍රාත්කරුවකුට සම්බන්ධතාවක් ඇති වෙනත් කැණීම් බිම්කොටසක පිහිටා ඇති අවස්ථාවක සහ සම්පූර්ණ ඛනිජතෙල් සම්පත් ආකරයම, ඒ කොටස සමග එක්ව ගෙන වාණිජ පදනමක් මත වඩාත් කාර්යක්ෂම ලෙස සංවර්ධනය කළ හැකි අවස්ථාවක, ඛ.ස.සං.කමිටුව විසින් ඒ ආකරයෙන් වඩාත් ඵලදායක ලෙස ඛනිජතෙල් සොයා ගැනීම හෝ ප්‍රයෝජනයට ගැනීම සහතිකවීම පිණිස ආකරය ඒකාබද්ධව සංවර්ධනය කිරීම සඳහා එකී වෙනත් පාර්ශ්වයන් සමඟ ඒකක සංවර්ධන ගිවිසුමකට එළඹෙන ලෙස එම කමිටුව විසින් කොන්ත්‍රාත්කරුට නියම කරනු ලැබිය හැකි ය. ඒකක සංවර්ධනය.

(2) (අ) ඒකාබද්ධ ඛනිජතෙල් මෙහෙයුම් සිදුකිරීම සඳහා ඛ.ස.සං.කමිටුවේ අනුමතය ඇතිව ඒකක සංවර්ධන ගිවිසුමකට කොන්ත්‍රාත්කරුවන් දෙදෙනකු හෝ ඊට වැඩි ගණනක් ඇතුළත් වූ අවස්ථාවක, හෝ ;

(ආ) කොන්ත්‍රාත්කරුවන්ගේ කැණීමේ බිම් කොටස් කීපයක මායිම් ඇතුළත හෝ ඔවුන්ගේ සංවර්ධන බලපත්‍ර කිහිපයක් මගින් ආවරණය වන ප්‍රදේශ තුළ පිහිටා ඇති පොදු ඛනිජ තෙල් ආකරයක් සම්බන්ධයෙන් කොන්ත්‍රාත්කරුවන් විසින් ඒකාබද්ධ ඛනිජ තෙල් මෙහෙයුම් සිදු කළ යුතු බවට ඒ එක් එක් කොන්ත්‍රාත්කරු වෙත නිකුත් කරනු ලැබූ සංවර්ධන බලපත්‍රයේ කොන්දේසියක් වන අවස්ථාවක,

එම ආකරයේ ඒකක සංවර්ධනයට සහභාගි වන ලෙස ඛ.ස.සං.කමිටුව විසින් එම කොන්ත්‍රාත්කරුවන් වෙත විධාන කළ හැකි ය.

19. (1) ඛනිජතෙල් සම්පත් ගිවිසුමක් යටතේ හෝ සංවර්ධන බලපත්‍රයක් යටතේ යම් කොන්ත්‍රාත්කරුවකු විසින් සිදු කරනු ලබන හෝ සිදු කිරීමට යෝජිත ඛනිජතෙල් මෙහෙයුම් සඳහා කොන්ත්‍රාත්කරුවකුහට යම් චංචල හෝ නිශ්චල දේපළක් අවශ්‍යවන අවස්ථාවක සහ එම අවශ්‍යතාව පිළිබඳව ඛ.ස.සං.කමිටුවට දන්වනු ලබන අවස්ථාවක එම චංචල හෝ නිශ්චල දේපළ ඛ.ස.සං.කමිටුවේ ව්‍යාපාරවල කාර්ය සඳහා අවශ්‍ය දේපළක් ලෙස සලකනු ලැබිය යුතු අතර, අවස්ථානුගත කරුණු සැලකිල්ලට ගෙන ඒ අත්කර ගැනීම අවශ්‍ය බව ඛ.ස.සං.කමිටුව සලකන්නේ නම් එම දේපළ ආණ්ඩුව විසින් අත්කරගෙන කොන්ත්‍රාත්කරුට ලබා දිය යුතු ය. කොන්ත්‍රාත්කරුවන් සඳහා දේපළ අත්කර ගැනීම.

(2) (1) වන උපවගන්තියේ සඳහන් යම් දේපළක් අත්කර ගැනීම සඳහා ඛ.ස.සං.කමිටුව විසින් ගෙවිය යුතු යම් මුදලක් කොන්ත්‍රාත්කරු විසින් ගෙවිය යුතු අතර, එම මුදල නියම කරනු ලබන ආකාරයට ගණන් බලනු ලැබිය යුතු ය.

## IV වන කොටස

### ලේකම් කාර්යාලයේ කර්තව්‍ය

ලේකම් කාර්යාලය.

**20.** (1) ඛනිජතෙල් සම්පත් අධ්‍යක්ෂවරයා විසින් ප්‍රධානත්වය දරන ලේකම් කාර්යාලයක් පිහිටුවනු ලැබිය යුතු ය. අමාත්‍ය මණ්ඩලය විසින් කලින් කල එම ලේකම් කාර්යාලයට පවරනු ලබන කර්තව්‍ය එම ලේකම් කාර්යාලය විසින් ඉටු කරනු ලැබිය යුතු ය. රජය සමග ඇතුළත් වූ ඛනිජතෙල් සම්පත් ගිවිසුම්වලට අදාළ සියලු කාර්ය සඳහා රජය වෙනුවෙන් සහ රජය සඳහා ලේකම් කාර්යාලය ක්‍රියා කළ යුතු අතර –

(අ) ඒ ගිවිසුම් යටතේ කොන්ත්‍රාත්කරුවන් විසින් ඉදිරිපත් කරනු ලබන වාර්ෂික වැඩසටහන් සහ අය වැය අනුමත කිරීමට ;

(ආ) ඒ ගිවිසුම යටතේ ඛනිජතෙල් සම්පත්වල රජයේ කොටස සොයාගෙන එය විකිණීම, ගබඩා කිරීම සහ ප්‍රවාහනය කිරීම සඳහා කටයුතු සැලැස්වීමට ;

(ඇ) ඛනිජතෙල් සම්පත් ගිවිසුම් පිළිබඳව රජයට ඇති ගිවිසුම් සහ මෙහෙයුම් සම්බන්ධතා පිළිබඳව එවැනි වෙනත් කර්තව්‍ය ඉටුකිරීමට,

එම ලේකම් කාර්යාලයට අයිතිය තිබිය යුතු ය.

(2) 6 වන වගන්තියේ (අ), (ඇ), (ඈ), (ඉ), (ඊ), (උ), (ඌ) යන ඡේදවලින් ඛ.ස.සං.කමිටුව වෙත පවරා ඇති හෝ සතු කර දී ඇති කර්තව්‍ය සහ බලතලවලින් යම් කිසිවක් ඛ.ස.සං.කමිටුව විසින් ඛනිජතෙල් සම්පත් අධ්‍යක්ෂජනරාල්වරයා වෙත පවරනු ලැබිය හැකි ය.

රාජ්‍ය සේවයේ නිලධරයන් අනුයුක්ත කිරීම.

**21.** (1) ලේකම් කාර්යාලයේ ඉල්ලීම මත රාජ්‍ය සේවයේ යම් නිලධරයකු එම නිලධරයාගේ කැමැත්ත ඇතිව සහ රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ

ලේකම්වරයාගේ කැමැත්ත ඇතිව ලේකම් කාර්යාලය විසින් තීරණය කරනු ලැබිය හැකි යම් කාලයක් සඳහා ලේකම් කාර්යාලයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය, නැතහොත් එවැනිම කැමැත්ත ඇතිව ලේකම් කාර්යාලයට ස්ථිර වශයෙන් පත් කරනු ලැබිය හැකි ය.

(2) යම් නිලධරයකු ලේකම් කාර්යාලයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 13 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස්කිරීම් සහිතව ඒ තැනැත්තාට හෝ ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(3) යම් නිලධරයකු ලේකම් කාර්යාලයේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබූ අවස්ථාවක, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 13 වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව ඔහුට හෝ ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(4) මේ පනත ක්‍රියාත්මක වන දිනයේ දී රාජ්‍ය සංස්ථාවක් විසින් සේවයේ නියුක්ත කරනු ලැබූ යම් තැනැත්තකු, ඒ නිලධරයාගේ හෝ සංස්ථාවේ කැමැත්ත ඇතිව ලේකම් කාර්යාලයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව හෝ ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(5) යම් නිශ්චිත කාලසීමාවක් සඳහා ආණ්ඩුව සමග සේවය කිරීමට ගිවිසුමකට ඇතුළත් වූ යම් තැනැත්තකු ලේකම් කාර්යාලය විසින් සේවයේ නියුක්ත කරනු ලබන අවස්ථාවක දී, ඒ තැනැත්තා විසින් ලේකම් කාර්යාලය සමග කරනු ලබන සේවා කාලය එකී ගිවිසුමේ බැඳීම් ඉටුකිරීමේ කාර්ය සඳහා ආණ්ඩුවට කරනු ලබන සේවාවක් ලෙස සලකනු ලැබිය යුතු ය.

## V වන කොටස

### මුදල් විධිවිධාන

**22.** (1) සෑම ඛනිජතෙල් සම්පත් ගිවිසුමක් යටතේ සිදු කරනු ලබන ඛනිජතෙල් මෙහෙයුම්වලින් සොයා ගනු ලබන ඛනිජතෙල් සම්පත්වල පිළිවෙලින්, කොන්ත්‍රාත්කරුට සහ රජයට හිමි කොටස් එවැනි සෑම ගිවිසුමකම සඳහන් කළ යුතු ය. නිෂ්පාදනය, කොටස් බෙදීම ආදිය පිළිබඳ නියමයන්.

(2) ඛනිජතෙල් සම්පත් ගිවිසුම මගින් පහත සඳහන් මූල්‍ය කරුණු පිළිබඳ විධිවිධාන සලස්වනු ලැබිය යුතු ය :–

(අ) ගිවිසුම යටතේ පවත්වන ලද ඛනිජතෙල් මෙහෙයුම් සඳහා කොන්ත්‍රාත්කරුගේ වියදම් ලබාගැනීම ;

(ආ) සොයාගනු ලැබූ ඛනිජතෙල් සම්පත්වල රජයට අයත් කොටසේ යම් වැඩිවීමක් (ඒ වැඩිවීම කොන්ත්‍රාත්කරුගේ ඛනිජතෙල් මෙහෙයුම් ලාභයට ප්‍රමාණානුකූලව විය යුතු ය) ;

(ඇ) මේ පනතේ මේ කොටසේ විධිවිධානවලට අනුව, සොයාගනු ලබන සම්පූර්ණ ඛනිජ තෙල් සම්පත් මුළු ප්‍රමාණය මත ඛනිජතෙල් සම්පත්වල රාජ්‍ය භාගය ගෙවීම ; සහ

(ඈ) පාරිතෝෂික ඇත්නම්, කොන්ත්‍රාත්කරු විසින් රජයට ගෙවිය හැකි පාරිතෝෂික.

බදු වැඩිකිරීම සිදුවන අවස්ථාවක නියමයන් වෙනස් කිරීම.

**23.** ඛනිජතෙල් සම්පත් ගිවිසුමට ඇතුළත් වූ දිනයේ දී බලාත්මකව පැවති බදු, ගාස්තු හෝ අයකිරීම්වලට අමතරව යම් ඛනිජතෙල් මෙහෙයුමකින් කොන්ත්‍රාත්කරුට ලැබුණු ආදායම මත හෝ ගිවිසුම යටතේ කොන්ත්‍රාත්කරුට හිමිකම ඇති ඛනිජතෙල්වල කොටස මත බදු, ගාස්තු හෝ අයකිරීම් පනවමින් අවස්ථාවෝචිත පරිදි යම් නීතියක් හෝ නියෝගයක් පනවන හෝ ප්‍රසිද්ධ කරන අවස්ථාවක, සොයාගනු ලැබූ ඛනිජතෙල් සම්පත්වල කොන්ත්‍රාත්කරුට හිමි කොටස වෙනස් කිරීම සඳහා ඉඩ සලසන නියමයන් සෑම ඛනිජතෙල් සම්පත් ගිවිසුමකම ඇතුළත් විය යුතු ය.

ලාභ සහ ආදායම තීරණය කිරීම.

**24.** ඛනිජතෙල් සම්පත් මෙහෙයුම් කැණීම් සහ ප්‍රයෝජනයට යොදා ගැනීමට අදාළ යම් මෙහෙයුමකින් ලැබෙන කොන්ත්‍රාත්කරුගේ ලාභ සහ ආදයම හා සම්බන්ධයෙන් 2000 අංක 38 දරන දේශීය ආදයම් බදු පනතේ විධිවිධාන අදාළ විය යුතු ය.

ඛනිජතෙල් සම්පත්වල රාජ්‍ය භාගය.

**25.** (1) සංවර්ධන බලපත්‍රයක් යටතේ සොයා ගනු ලබන ඛනිජතෙල් සම්පත් සියල්ලේ වටිනාකම මත කොන්ත්‍රාත්කරු විසින් ඛනිජතෙල් සම්පත්වල රාජ්‍ය භාගය රජයට ගෙවිය යුතු අතර, අදළ ඛනිජතෙල් සම්පත් ගිවිසුමේ නියම කර ඇති ආකාරයට රාජ්‍ය භාගය මුදලින් හෝ අන්‍යාකාරයකින් ලබාගැනීමට රජයට අභිමතයක් ඇත්තේ ය.

(2) සොයා ගනු ලබන ඛනිජතෙල් සම්පත් මැනීමේ ක්‍රම සහ රාජ්‍ය භාගය ගෙවීමේ කාලසීමාව අදාළ ඛනිජතෙල් සම්පත් ගිවිසුමේ නියම කර ඇති ආකාරයට විය යුතු ය.

26. (1) සොයා ගනු ලැබූ ඛනිජතෙල්වල කොන්ත්‍රාත්කරුගේ කොටස සියලු රේගු සහ අපනයන බදුවලින් නිදහස් විය යුතු ය. රේගු බදු ආදියෙන් නිදහස් බව.

(2) ඛනිජතෙල් සම්පත් ගිවිසුමක කොන්දේසි යටතේ ඛනිජතෙල් මෙහෙයුම් කටයුතු සිදුකිරීම සඳහා කොන්ත්‍රාත්කරුවකු විසින් ආනයනය කරනු ලබන යන්ත්‍රෝපකරණ සහ උපකරණ මත රේගු බදු ගෙවීමෙන් කොන්ත්‍රාත්කරුවා නිදහස් විය යුතු අතර, එවැනි යන්ත්‍රෝපකරණ සහ උපකරණ නැවත අපනයනය කිරීම සඳහා කිසිම අපනයන බද්දක් ගෙවනු නොලැබිය යුතු ය.

## VI වන කොටස

### සාමාන්‍ය

27. (1) මේ පනතේ ප්‍රතිපත්ති සහ විධිවිධාන පවත්වාගෙන යාමේ සහ ක්‍රියාත්මක කිරීමේ කාර්ය සඳහා සහ නියම කළ යුතු යයි මේ පනතින් නියම කාරණ සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය. නියෝග.

(2) (1) වන උපවගන්තිය යටතේ සාදන ලද සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එම නියෝගය එසේ පළ කරනු ලැබූ දින සිට හෝ ඒ නියෝගයේ නිශ්චිතව දක්වා ඇති පසු දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ සාදන ලද සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසු හැකි පහසු ඉක්මණින් අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක් එම අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු නමුත් ඒ යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් හානියක් නොවිය යුතු ය.

(4) යම් නියෝගයක් පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

ඇතුල්වීමේ බලතල.

**28.** ඛ.ස.සං.කමිටුව විසින් ලිඛිතව බලය පවරනු ලැබූ යම් තැනැත්තකු විසින් ඛනිජතෙල් මෙහෙයුම් සිදු කරන සහ පවත්වාගෙන යන යම් වැඩබිමකට කවර හෝ අවස්ථාවක දී ඇතුළු වී එය පරීක්ෂා කළ හැකි අතර, ඛනිජතෙල් සම්පත් ගිවිසුමක නියමයන් හෝ සංවර්ධන බලපත්‍රයකට අදාළව පනවනු ලැබූ කොන්දේසි හෝ මේ පනතේ හෝ එය යටතේ සාදන ලද යම් නියෝගයක විධිවිධානවලට හෝ අනුකූලව ක්‍රියාකරන්නේ ද යන්න දැනගැනීම සඳහා අවශ්‍ය වන යම් විමර්ශනයක් හෝ පරීක්ෂණයක් පවත්වනු ලැබිය හැකි ය.

වැරදි සහ දණ්ඩන.

**29.** (1) (අ) 7 වන වගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරමින් ඛනිජතෙල් මෙහෙයුම් සිදු කරන ;

(ආ) 28 වන වගන්තිය යටතේ බලය පවරනු ලැබූ තැනැත්තකු විසින් මේ පනත මගින් හෝ ඒ යටතේ පවරනු ලැබූ යම් බලතල ක්‍රියාත්මක කිරීමේ දී එම තැනැත්තාට ප්‍රතිරෝධය දක්වන හෝ බාධා කරන ;

(ඇ) 6 වන වගන්තියේ (ග) ඡේදය යටතේ නිකුත් කරන ලද දැන්වීමක නියමයන්ට අනුකූලව ක්‍රියා කිරීම සාධාරණ හේතුවක් නොමැතිව පැහැර හරින ;

(ඈ) 6 වන වගන්තිය යටතේ තමා විසින් ඉදිරිපත් කළ යම් වාර්තාවක හෝ තොරතුරක හෝ කැණීමේ බිම් කොටසක් සම්බන්ධයෙන් ඛනිජතෙල් සම්පත් ගිවිසුමකට ඇතුළත් වීමට කරන ලද යම් ඉල්ලීමක දැන දැනම යම් අසත්‍ය ප්‍රකාශයක් සිදු කරන ;

(ඉ) 6 වන වගන්තිය යටතේ තමා විසින් ඉදිරිපත් කරන ලද යම් වාර්තාවක හෝ තොරතුරක නැතහොත් කැණීමේ බිම් කොටසක් සම්බන්ධයෙන් ඛනිජතෙල් සම්පත් ගිවිසුමකට ඇතුළත් වීමකට කරන ලද ඉල්ලීමක යම් වැදගත් සිද්ධිමය කරුණක් හිතාමතා අත්හරින ;

(ඊ) යම් ඛනිජතෙල් මෙහෙයුම්වලට සිතාමතා අලාභ කරන, හෝ එවැනි මෙහෙයුම් හිතාමතා කඩාකප්පල් කරන ;

(උ) ඛනිජතෙල් සම්පත්වල රජයට අයත් කොටස හෝ ඛනිජතෙල් සම්පත්වල රාජ්‍ය භාගය වංචා සහගත ලෙස හෝ නොසැලකිලිමත් ලෙස රජයට අහිමි කරන ;

(ඌ) මේ පනත යටතේ සාදන ලද යම් නියෝගයක් කඩ කරන,

යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කිරීමේ දී රුපියල් මිලියන හතරකට නොඅඩු සහ රුපියල් මිලියන සියයකට නොවැඩි දඩයකට හෝ අවුරුදු එකකට නොවැඩි කාලයක් සඳහා වූ බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ ඔහු යටත් විය යුතු ය. තව ද, ඔහු වරදකරු කරනු ලැබුවේ කවර වරදක් සඳහා ද එකී වරද ඔහු වරදකරු කරනු ලැබූ පසුව ද දිගටම සිදුවන්නේ නම් එවැනි විටක ඔහු තවදුරටත් වරදකට වරදකරු විය යුතු අතර, ඒ සම්බන්ධයෙන් එම වරද සිදුකරගෙන යන එක් එක් දිනය සඳහා දිනකට රුපියල් පන්දහසකට නොවැඩි දඩයකට ද ඔහු යටත් විය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ (උ) ඡේදය යටතේ වරදකට යම් තැනැත්තකු වරදකරු වන අවස්ථාවක, එම වරද සංයුක්ත වන ක්‍රියාවේ ප්‍රතිඵලයක් වශයෙන් රජයට අහිමි වූ ඛනිජතෙල් සම්පත්වල වටිනාකම හෝ ඛනිජ තෙල් සම්පත්වල රාජ්‍ය භාගයට සමාන මුදලක් වන්දි වශයෙන් රජයට ගෙවන ලෙස මහෙස්ත්‍රාත්වරයා විසින් එම වරදකරුට නියම කරනු ලැබිය හැකි ය.

**30.** මේ පනත යටතේ වූ යම් වරදක් සංස්ථාවක් විසින් සිදු කරනු ලබන විට, ඒ වරද සිදුකළ අවස්ථාවේ දී එම සංස්ථාවේ අධ්‍යක්ෂවරයකු, කළමනාකාරවරයකු, ලේකම්වරයකු හෝ වෙනත් සමාන නිලධරයකු වූ සෑම තැනැත්තකුම, එම වරද සිදුකරන ලද්දේ තමාගේ කැමැත්ත හෝ ආධාරය නොමැතිව බවට සහ ඔහුගේ කර්තව්‍යවල ස්වභාවය සහ සියලු අවස්ථානුගත කරුණු සැලකිල්ලට ගෙන ඔහු විසින් ඉටු කළ යුතුව තිබූ පරිදි එම වරද වැළැක්වීම සඳහා නියි උද්යෝගයෙන් ක්‍රියාකළ බවට ඔප්පු කරන්නේ නම් මිස, ඔහු එම වරදට වරදකරු ලෙස සලකනු ලැබිය යුතු ය.

පුද්ගල මණ්ඩල විසින් සිදු කරනු ලබන වැරදි.

**31.** 1961 අංක 28 දරන ලංකා ඛනිජතෙල් සංස්ථා පනතේ 5ඇ, 5ඊ, 5උ සහ 34අ වගන්ති මෙයින් ඉවත් කරනු ලැබේ.

1961 අංක 28 දරන පනත සංශෝධනය කිරීම.

මේ පනත වෙනත් නීති අභිබවා සිටිය යුතු බව.

**32.** වෙනත් යම් ලිඛිත නීතියක කුමක් සඳහන් වුව ද මේ පනතේ විධිවිධාන බලාත්මක විය යුතු අතර, ඒ අනුව මේ පනතේ විධිවිධාන සහ වෙනත් යම් නීතියක් අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට මේ පනතේ විධිවිධාන බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**33.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අර්ථ නිරූපණය.

**34.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ පනතේ

"යාබද කලාප" යන්නෙන්, ජාතික රාජ්‍ය සභාවේ 1976 අංක 22 දරන සමුද්‍රීය කලාප පිළිබඳ පනතේ 4 වන වගන්තිය යටතේ සාදන ලද ප්‍රකාශනය මගින් ශ්‍රී ලංකාවේ යාබද කලාපය බවට ප්‍රකාශයට පත් කරන කලාප අදහස් වේ.

"මහාද්වීපික අංශය" යන්නෙන්, 1982 එක්සත් ජාතීන්ගේ මුහුදු නීතිය පිළිබඳ සම්මුතියේ 76 වන වගන්තියේ අර්ථ නිරූපණය කොට ඇති මුහුදු පතුල සහ යට පස අදහස් වේ.

"කොන්ත්‍රාත්කරු" යන්නෙන්, ඛනිජතෙල් සම්පත් ගිවිසුමක් යටතේ ඛනිජතෙල් මෙහෙයුම් සිදුකිරීමට බලය පවරා ඇති දේශීය හෝ විදේශීය තැනැත්තකු හෝ සංස්ථාවක් අදහස් වන අතර, ඊට ඒකාබද්ධ ව්‍යාපාර මෙහෙයුම් ද ඇතුළත් වේ.

"සංස්ථාව" යන්නෙන්, 1961 අංක 28 දරන ලංකා ඛනිජ තෙල් සංස්ථා පනත මගින් පිහිටුවනු ලැබූ ලංකා ඛනිජ තෙල් සංස්ථාව අදහස් වේ.

"සංවර්ධන බලපත්‍රය" යන්නෙන්, කැණීමේ බිම් කොටසක නම් කරන ලද ප්‍රදේශයක් තුළ ඛනිජතෙල් සම්පත්වල වාණිජමය ප්‍රමාණයක් සොයා ගැනීම සහ තබා ගැනීම සඳහා බලය පවරන 10 වන වගන්තිය යටතේ නිකුත් කරනු ලැබූ අධිකාරි පත්‍රයක් අදහස් වේ.

"ඛනිජ තෙල් සම්පත් අධ්‍යක්ෂජනරාල්" යන්නෙන්, රජයේ නියෝජිතයා වශයෙන් අමාත්‍ය මණ්ඩලය විසින් පවරනු ලබන කර්තව්‍ය ඉටු කිරීම සඳහා පිහිටුවනු ලැබූ ලේකම් කාර්යාලයේ ප්‍රධානයා අදහස් වේ.

"ස්ව සම්පත් කලාපය" යන්නෙන්, ජාතික රාජ්‍ය සභාවේ 1976 අංක 22 දරන සමුද්‍රීය කලාප පිළිබඳ පනතේ 5 වන වගන්තිය යටතේ සාදන ලද ප්‍රකාශනය මගින් ප්‍රකාශයට පත් කරන ලද ස්ව සම්පත් කලාපය අදහස් වේ.

"කැණීමේ බිම් කොටස" යන්නෙන්, අදාළ ඛනිජතෙල් සම්පත් ගිවිසුමේ දක්වා ඇති කැණීමේ බිම් කොටසක් අදහස් වේ.

"ඓතිහාසික ජල ප්‍රදේශය" යන්නෙන්, ජාතික රාජ්‍ය සභාවේ 1976 අංක 22 දරන සමුද්‍රීය කලාප පිළිබඳ පනතේ 9 වන වගන්තිය යටතේ සාදන ලද ප්‍රකාශනය මගින් ප්‍රකාශයට පත් කරන ලද ඓතිහාසික ජල ප්‍රදේශයේ සීමාවන් අදහස් වේ.

"ආයෝජකයා" යන්නට පෞද්ගලික අංශයේ ආයෝජකයකු, රාජ්‍ය අංශයේ ආයෝජකයකු, සහ රාජ්‍ය නියෝජ්‍යායතන හෝ රාජ්‍ය සංස්ථා ඇතුළත් විය හැකි ය.

"අමාත්‍යවරයා" යන්නෙන්, ඛනිජතෙල් සම්පත් සංවර්ධන විෂයය භාර අමාත්‍යවරයා අදහස් වේ.

"සහභාගිවීමේ සම්බන්ධතාව" යන්නෙන්, ඛනිජතෙල් සම්පත් ගිවිසුමේ දක්වා ඇති සහ සංවර්ධන බලපත්‍රය යටතේ සොයා ගනු ලැබූ සහ තබාගෙන ඇති ඛනිජතෙල් සම්පත්වල කොටසේ ප්‍රතිශතයට ඇති අයිතිවාසිකම මගින් ප්‍රකාශිත සම්බන්ධතාවක් අදහස් වේ.

"ඛනිජතෙල් මෙහෙයුම්" යන්නෙන්, භූවිද්‍යාත්මක සමීක්ෂණ, භූමිකම්පා දත්තයන් කියවීම, පොළව හෑරීම, නිෂ්පාදන පරීක්ෂා කිරීම, වෙන් කිරීම, සැකසුම් කිරීම, ගබඩා කිරීම, සොයා ගැනීම, ප්‍රවාහනය කිරීම සහ අලෙවි කිරීම ඇතුළත් වන එහෙත් ඒවාට සීමා නොවන ඛනිජතෙල් සම්පත් කැණීම, සංවර්ධන කිරීම සහ සොයා ගැනීමේ කටයුතු ඇතුළත් වේ.

"ඛණිජ තෙල් ආකරය" යන්නෙන්, ස්වාභාවික ආකාරයෙන් දක්නට ලැබෙන වෙන්ව පවත්නා ඛනිජතෙල් සම්පත් එකතුවක් අදහස් වේ.

"ඛනිජතෙල් සම්පත්" යන්නෙන්, ස්ථානයේ තිබී හමු වූ හෝ ඛනිජතෙල් මෙහෙයුම්වල දී සොයාගත් තෙල්වල සහ ගෑස්වල Hydrate සල්පර් සහ හයිඩ්‍රොකාබන් සමග

ආශ්‍රිත වෙනත් ස්ථාන, ද්‍රව්‍ය ඇතුළු ස්වාභාවික ද්‍රවණ, වායු, ඝණ ද්‍රව්‍ය හෝ අර්ධ ඝණ ද්‍රව්‍ය වශයෙන් ඇති බොර තෙල්, ස්වාභාවික වායු සහ හයිඩ්‍රෝකාබන් අදහස් වේ.

"බනිජතෙල් සම්පත් ගිවිසුම" යන්නෙන්, නිෂ්පාදන කොටස් බෙදා ගැනීම සඳහා රජය සහ එක් කොන්ත්‍රාත්කරුවකු හෝ කොන්ත්‍රාත්කරුවන් වැඩිදෙනකු අතර මේ පනතේ 9 වන වගන්තිය ප්‍රකාරව එළඹෙන ගිවිසුමක් අදහස් වේ.

"බනිජතෙල් සම්පත් සංවර්ධන කමිටුව (බ.ස.සං.කමිටුව) යී" යන්නෙන්, බනිජතෙල් සම්පත් පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා පාලන මණ්ඩලයක් වශයෙන් පිහිටුවනු ලැබූ කමිටුව අදහස් වේ.

"බනිජතෙල් සම්පත්වල රාජ්‍ය භාගය" යන්නෙන්, සංවර්ධන බලපත්‍රයක් මගින් ආවරණය වන ප්‍රදේශයෙන් සොයාගනු ලබන්නා වූ සියලු බනිජතෙල් සම්පත්වල වෙළෙඳපල වටිනාකම මත කොන්ත්‍රාත්කරුවකු විසින් ගෙවිය යුතු රාජ්‍ය භාගය අදහස් වේ.

"සේවා උප කොන්ත්‍රාත්කරු" යන්නෙන්, කොන්ත්‍රාත්කරුවකු සඳහා හෝ වෙනුවෙන් බනිජතෙල් මෙහෙයුම් සඳහා භාණ්ඩ හා සේවා සපයනු ලබන තැනැත්තකු අදහස් වේ.

"දේශීය මුහුදු තීරය" යන්නෙන්, ජාතික රාජ්‍ය සභාවේ 1976 අංක 22 දරන සමුද්‍රීය කලාප පිළිබඳ පනතේ 2 වන වගන්තිය යටතේ කරනු ලැබ ඇති ප්‍රකාශනය මගින් ශ්‍රී ලංකාවේ දේශීය මුහුදු තීරය වශයෙන් ප්‍රකාශයට පත්කර ඇති මුහුදු සීමා අදහස්වන අතර, ශ්‍රී ලංකා අභ්‍යන්තර ජල තීරය ද ඊට ඇතුළත් වේ.

"ඒකක සංවර්ධනය" යන්නෙන්, කැණීමේ බිම් කොටස් එකක් හෝ කිහිපයක මායිම් තුළ පිහිටි හෝ සංවර්ධන බලපත්‍ර දෙකක හෝ වැඩි ගණනක ආවරණය වන බිම් ප්‍රදේශය තුළ පිහිටියා වූ පොදු ආකරයක සංවර්ධනය අදහස් වේ.

"ඒකක සංවර්ධන ගිවිසුම" යන්නෙන්, බණිජතෙල් සම්පත්වල පොදු ආකරයක් සම්බන්ධයෙන් බනිජතෙල් මෙහෙයුම් කටයුතු ඒකාබද්ධව සිදුකිරීම සඳහා කොන්ත්‍රාත්කරුවන් දෙදෙනකු හෝ වැඩිදෙනකු අතර ගිවිසුමක් අදහස් වේ.

පාර්ලිමේන්තුවේ සිංහල පතත් කෙටුම්පත්වල සහ පතත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.